තලවාකැලේ - ලිඳුල නගර සභාව

නුවරඑළිය දිස්ත්‍රික්කය

------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 පෙබරවාරි 28 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 පෙබරවාරි 29 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ජූලි 25 දින ලේකම්වරයා වෙත යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට තලවාකැලේ - ලිඳුල නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

(අ). 2013 සහ 2014 වර්ෂවල " ඊ නැණසල" පාඨමාලා ගාස්තු ලෙස සභාවට ලැබුණු රු.40,550 ක් අදාල වර්ෂවලදී ආදායමට බැර කිරීමට කටයුතු නොකර ආපසු ගෙවිය යුතු තැන්පතු යටතේ ගිණුම්ගත කර තිබුණු බැවින් සමාලෝචිත වර්ෂය අවසානයට සමුච්චිත අරමුදල් ගිණුමේ ශේෂය එම වටිනාකමින් අඩුවෙන්ද තැන්පතු ගිණුමේ ශේෂය එම වටිනාකමින් වැඩියෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂය තුළ අයකර තිබුණු විනෝද බදු රු.28,500ක් ආදායමට බැර නොකර තැන්පත් ගිණුමට බැරකර තිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ ආදායම රු.28,500ක් අඩුවෙන්ද සමාලෝචිත වර්ෂය අවසානයට තැන්පතු ගිණුමේ ශේෂය රු.28,500ක් වැඩියෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

1.3.2 ගෙවිය යුතු ගිණුම්

----------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 01 සිට වසර 09 දක්වා කාල පරාසයක් ගත වී ඇති ගෙවිය යුතු ගිණුම් ශේෂ 06 ක එකතුව වූ රු.8,231,906 ක ගෙවීම් නිරවුල්කර නොතිබුණි.

1.3.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම.

--------------------------------------------------------

රු.80,323ක වත්කම් විෂයයන් 04ක් ලිඛිත සාක්ෂි ඉදිරිපත් නොවීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට හෝ පිළිගැනීමට හෝ නොහැකි විය.

1.3.4 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම.

------------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ). ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| i. මු.රෙ 189 හා 486 | 2002 දෙසැම්බර් සිට 2016 සැප්තැම්බර් අතර කාල පරිච්ඡේදය තුල සභාවට ලැබී අගරු වී තිබුණු වටිනාකම රු.446,178 ක් වූ චෙක්පත් 04 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ආ). විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් හා අර්ථසාධක අරමුදල් කළමනාකරණ මණ්ඩලයේ සභාපතිගේ 2010 මැයි 25 දිනැති අංක 4/2010 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය. | සමාලෝචිත වර්ෂයේ දෛනික ගෙවීමේ පදනම මත සේවයේ යොදවා සිටි සෞඛ්‍ය කම්කරුවන් දෙදෙනෙකුට ගෙවා තිබුණු රු.489,600 ක දීමනා වෙනුවෙන් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව ගෙවිය යුතු රු 97,920 ක දායක මුදල් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට ගෙවා |

| | | |
|---|---|---|
| | | නොතිබුණි. |
| (ඇ). | පළාත් පාලන කොමසාරිස්ගේ 1988 මැයි 17 දිනැති අංක 1988/ 22 දරන චක්‍රලේඛය. | වරිපනම් බදු සඳහා දේපල තක්සේරුව වසර 05කට වරක් සිදුකල යුතු වුවද, 2011 වර්ෂයට පසු එසේ තක්සේරු කර නොතිබුණි. |
| (ඇ). | මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස්ගේ අංක මප/ප.පා.කො/ 2016/03 හා 2016 මාර්තු 17 දිනැති චක්‍රලේඛය | කඩ කාමර කුලී වසර 05කට වරක්වත් තක්සේරු කළ යුතු වුවද සභාව සතු කඩ කාමර 32ක් සඳහා 2007 වර්ෂයට පසු කුලී තක්සේරුවක් සිදුකර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.9,486,470 ක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.6,486,183 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.3,000,287 ක වර්ධනයක් සිදුවී තිබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රතිඵලයේ රු.3,000,287 ක වර්ධනයට ප්‍රධාන වශයෙන් එක් ආදායම් විෂයයක ආදායම වැඩිවීමද, වියදම් විෂයයන් 3 ක වියදම අඩුවීමද, ආදායම් විෂයයන් 3 ක ආදායම් අඩුවීමද එක් වියදම් විෂයයක වියදම වැඩිවීමද ඇතුළුව අනෙකුත් ආදායම් හා වියදම් විෂයයන්වල වෙනස්වීම් බලපා තිබුණි.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය.

සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවති රු.252,048 ක හිග ගෙවල් කුලී සහ බිම් බදුවලින් කිසිදු මුදලක් වර්ෂය තුල අයකර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයට අයකර නොතිබුණු මුළු ගෙවල් කුලී සහ බිම් බදු ප්‍රමාණය රු.417,658 ක් විය.

2.3.2. වරිපනම් බදු.

----------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.3,627,592 ක වරිපනම් බදු අයවිය යුතුව පැවතියද එම මුදල් අයකර ගැනීම සඳහා නගර සභා ආඥා පනතේ 170 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණු අතර මෙම මුදලින් රු.1,632,028 ක් වසරකට වැඩි කාලයක් හිඟහිටව පැවතුණි.

2.3.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු.

-------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.171,826 ක් හා ඉඩම් හුවමාරු කිරීමේ මුද්දර ගාස්තු රු.81,500ක් අයවිය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය.

-----------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා.

-----------------------------------

(අ). සභාවේ පොදු වෙළඳපොලේ කඩ කාමර 21 කට අදාළ බදු ගිවිසුම්වල වලංගු කාලය ඉක්මවා තිබුණද නව ගිවිසුම්වලට එළඹීමට කටයුතු කර නොතිබුණි.

(ආ). 2015 ජුනි මස ආරම්භ කරන ලද ගව ඝාතකාගාරය සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබාගෙන නොතිබුණි.

(ඇ). සභාව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශනයේ උපලබ්ධි නොවූ ලැබීම් ලෙසට වසර 04 කට අධික කාලයක සිට ඉදිරියට ගෙන එන රු.410,726 ක ශේෂය නිරවුල් කර නොතිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා.

--------------------------------

2013 හා 2014 වර්ෂවල රු.901,900 ක් වැයකර ආරම්භකර තිබුණු කොත්මලේ ඔය හා ජලාශය අශ්‍රිත බෝට්ටු සේවා ව්‍යාපෘතිය සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර ආදායමක් උපයා ගැනීමට කටයුතුකර නොතිබුණි.

3.3 නිෂ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්

---

සභාව සතු පිරිවැය රු.6,180,000 ක් වූ මයික්‍රෝ වර්ගයේ කැබ්රථය පරිහරණයට නුසුදුසු බැවින් 2012 වර්ෂයේදී වෙන්දේසි කිරීමට තීරණයකර තිබුණද, වෙන්දේසි නොකර නිෂ්කාර්යව සභා භූමියේ රඳවා තිබුණි.

3.4 කොන්ත්‍රාත් පරිපාලනය.

---

සභාවේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයට පිවිසීමට ඉදිකර තිබුණු විකල්ප මාර්ගය සඳහා රු.1,689,353 ක් ගෙවා මාර්ගයට යොදා තිබුණු කොන්ක්‍රීට් මිශ්‍රණය ඉතා දුර්වල තත්ත්වයක පැවතුණි. එමෙන්ම මාර්ගයට නොයෙදූ කොන්ක්‍රීට් ඝන මීටර් 3.15 කට රු. 42,320ක වැඩිපුර ගෙවීමක්ද කර තිබුණි.

3.5 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය.

---

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ). සභාව පවත්වාගෙන යන ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථානයට රැගෙන එන සභා බල ප්‍රදේශයේ කසල වර්ග කිරීමකින් තොරව පස්දමා වසාදැමීම සිදුකරන අතර මධ්‍යස්ථානයේ කටයුතු කරගෙන යාම සඳහා ප්‍රමාණවත් කම්කරුවන්ද යොදවා නොතිබුණි.

(ආ). සභා බල ප්‍රදේශයේ ජනතාවට කසල කළමනාකරණ කටයුතු සඳහා බෙදාහැරීමට සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් මස රු.189,727 ක් වැයකර කසල බඳුන් 100 ක් මිලදී ගෙන තිබුණද, එයින් රු.102,452 ක් වටිනා කසල බඳුන් 54 ක් නිකුත් නොකර සභා භූමියේ රඳවා තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

---

4.1 අයවැය පාලනය.

---

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් 04 ක සියයට 09 සිට සියයට 31 දක්වාද වියදම් විෂයයන් 07 ක සියයට 09 සිට සියයට 71 දක්වාද විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණි.

5. පද්ධති හා පාලන.

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන  ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

| | පද්ධති හා පාලන  ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|---|
| (අ). | ආදායම් පරිපාලනය. | සභාවට අයවිය යුතු හිඟ ආදායම් අයකරගෙන නොතිබීම. |
| (ආ). | ණයගැති/ ණයහිමි පාලනය. | විවිධ පාර්ශවයන්ගෙන් සභාවට අයවිය යුතු මුදල් අයකර ගැනීමට මෙන්ම විවිධ පාර්ශවයන්ට ගෙවිය යුතු ගෙවීම් නිරවුල් කිරීමටද කටයුතු කර නොතිබීම. |
| (ඇ). | වත්කම් පාලනය. | අපහරණය කළ යුතු වත්කම් අපහරණය කර සභාවට ආදායම් ලබාගැනීමට කටයුතු  නොකර එම වත්කම් සභාවේ රඳවාගෙන තිබීම. |
| (ඈ). | ගිණුම්කරණය. | ආදායමට බැර කළ යුතු ආදායම් තැන්පතු ගිණුම්වලට  බැරකර තිබීම. |